# හෙවෙයා බ්‍රසිලියෙන්සිස් ගැන විශේෂයෙන් සලකමින්, ජනකප්ලස්මය සුරැකීමේ වැදගත්කම

ආචාර්ය එන්. ඊ. එම්. ජයසේකර

වගා කර ඇති භෝගයන් ගෙන් බොහොමයක් ම වවා ඇත්තේ ඒවායේ ස්වාභාවික වාසස්ථානවලින් ඈත ය. දැන් පුළුල් ලෙස වගා කැරෙන කාර්මික භෝගයක් වූ රබර් බහුල ව වවනු ලබන්නේ දකුණු ආසියානු රටවල ය. ඒ, රබර් ගසේ ස්වාභාවික වාසස්ථානය වන දකුණු ඇමෙරිකාවේ ඇමේසන් නිම්නයට බොහෝ ඈතිනි. මෙසේ හඳුන්වා දෙන රබර් වැනි භෝගයන්ට පටු ප්‍රාවේණික මූලයක් ඇති විය යුතු ය. ශ්‍රී ලංකාවේ රබර් සිටුවුම් ද්‍රව්‍යවල මූලාරම්භය 1876 වසරේ දී වික්හම් ගේ එකතුවෙන් හඳුන්වා දුන් බීජ පැළ 1919 පමණ වූයේ ය. අනෙකුත් ගිණිකොන ආසියානු රටවලට රබර් බෙදාහරින කේන්ද්‍රස්ථානය ලෙසින් ශ්‍රී ලංකාව යොදා ගැනුනු බව විශ්වාස කැරේ. රබර් ගසේ ස්වාභාවික වාසස්ථානය වන ඇමේසන් නිම්න ප්‍රදේශයෙන් තව–තවත් ප්‍රාවේණික ද්‍රව්‍ය හඳුන්වා නොදෙන ලද්දේ දකුණු ඇමෙරිකානු පත්‍ර අංගමාරය නම් දරුණු රෝගය ගිණිකොන ආසියානු ප්‍රදේශයට පැමිණෙතැයි යන බිය නිසාවෙනි.

සාමාන්‍ය වශයෙන් රෝග ප්‍රතිරෝධය හා ශක්තිය සඳහා ද විශේෂ වශයෙන් ඉහළ අස්වනු සඳහා ද සිදු කරන ලද දිශානත වරණ වැඩ–සටහන් නිසා හෙක්ටාරයක රබර් අස්වැන්න සත් (7) ගුණයකින් වැඩි වී ඇතත් එවැනි දිශානත වරණය හේතු කොට ගෙන රබර් අභිජනන ද්‍රව්‍ය වල ප්‍රාවේණික විචල්‍යතාව හීන වී ගොස් ඇත. පැරණි සහ අත්හළ සිටුවුම් ද්‍රව්‍ය අතර තිබූ ප්‍රාවේණික විචල්‍යතාව සුරක්ෂිත කිරීමට සුදුසු සැලසුම් නො තිබූ බැවින් මෙ ගැටළුව තවත් බරපතළ වී තිබේ. ශ්‍රී ලංකාවේ රබර් වපසරියෙන් සියයට හැත්තෑවක් ම (70%) පීබී 86 නැමැති එකම ක්ලෝනය ම බව සැලකීමෙන් රබර් සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වයේ බැරෑරුම්කම මැනිය හැකි වේ.

ශාක දියුණු කිරීමේ වැඩ–සටහන්වල දී අභිජනන ගහණයේ ප්‍රාවේණික විචල්‍යතාව කෙරෙහි වරණය ක්‍රියා කරයි. ප්‍රාවේණික විචල්‍යතාව පටු වෙත්ම, වරණයට දක්වෙන ප්‍රතිචාරය ද අඩු වෙයි. මෙ අනුව; වරණයට ප්‍රතිචාර දැක්වීම පිරිහී යා නොදීමට නම්, කැලයේ වැවෙන සම වර්ගයේ නෑදෑ ගස් වැනි වෙනත් ප්‍රභවයන් ගෙන් අභිජනන ගහණය තුළට නිරතුරුවම ජාන ගලා ඒමක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය ය. වික්හම් ගේ මූලික හැඳින්වීම්වල ප්‍රාවේණික විචල්‍යතාව අප විසින් උපරිමයට ම උපයෝජනය කර ඇති බවත් ආර්ථික ව වැදගත් වන අස්වැන්න හා ශක්තිය වැනි ලක්ෂණ සම්බන්ධයෙන් අප පරියන්ත ලක්ෂ්‍යයට ළඟා වී ඇති බවත් හෙවෙයා අභිජනකයන් බොහෝ දෙනෙකු ගේ මතය යි.

දැනට පවත්නා අභිජනන ගහණයේ පටු ප්‍රාවේණික මූලය පුළුල් කිරීම සඳහා අළුත් හෙවෙයා ප්‍රාවේණික ද්‍රව්‍ය සඳහා ගවේෂණය ද එකතුව ද සුරැකීම ද කල යුතු බව හෙවෙයා අභිජනකයන්ට අවබෝධ විය.

ග්‍රාමීය සංවර්ධනය හා යෝධ කෘෂිකාර්මික ව්‍යාපෘති නිසා ඇමෙසන් ප්‍රදේශයේ ස්වාභාවික හෙවෙයා රුක් ගොමු විනාශවීමේ තර්ජනයකට ලක් වී ඇති හෙයින් එවැනි කටයුතුවල අවශ්‍යතාව තවත් වැදගත් විය.

වර්ෂ 1981 දී ජාත්‍යන්තර රබර් පර්යේෂණ හා සංවර්ධන මණ්ඩලයේ සාමාජික රටවල් විසින් බ්‍රසීලයේ ප්‍රාන්ත තුනකින් අළුත් හෙවෙයා ජනකප්ලස්ම ද්‍රව්‍ය එකතු කිරීම සඳහා අරමුදල් සපයන ලදී. ශාක එකතු කිරීමේ ජාත්‍යන්තර සංහිතාවට අනුකූල වන පරිදි එම බීජ වලින් සියයට පණහක් (50%) බ්‍රසීලයේ ම රඳවා ගැනුණි. ඉතිරියෙන් සියයට හැත්තෑපහක් (75%) ජාත්‍යන්තර රබර් පර්යේෂණ හා සංවර්ධන මණ්ඩලයේ ගිණිකොන ආසියානු සාමාජික රටවල් අතර බෙදා හැරීම සඳහා මලයාසියාවට යවන ලදී. අනෙක් සියයට විසිපහ (25%) අප්‍රිකානු රටවල අතර බෙදා හැරීම පිණිස අයිවරි කෝස්ට් වෙත යවනු ලැබීන.

දැනට මලයාසියාවේ පවත්වා-ගෙන යන ජනකප්ලස්ම ක්ලෝනයන් ගෙන් 10,000 ක් පමණ මුල් පියවරේදී හඳුන්වා දීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් සැලසුම් කර ඇත.

ජනක ප්ලාස්ම සංරක්ෂණයේදී බීජ ගබඩා කර තැබීමේ ක්‍රමය පහත සඳහන් ලක්ෂණ ඇති බෝග සඳහා සුදුසු නැත.

1. බීජ දිගු කලක් ගබඩා කල නොහැකි බෝග,
2. ක්ලෝනවල අනන්‍යතාවය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන වර්ධක ප්‍රචාරනයෙන් බෝ කරන බෝග.

මෙම ලක්ෂණ දෙකම රබර් ගසට අදාල වේ.

වර්ධක ප්‍රචාරණයෙන් බෝ කැරෙන, ක්ලෝන අනන්‍යතාව පවත්වා ගැනීම අවශ්‍යවූද බෝගවල හා බීජ දිගු කලක් තිස්සේ ගබඩා කර තැබිය නො හැකි බෝගවල ජනකප්ලස්ම එකතුවක් ලෙසින් ප්‍රවේණි ලක්ෂණ සුරැකීමේ කාර්යය සංකීර්ණ ය, දුෂ්කර ය. මෙම තත්ත්ව දෙක ම රබර්වලට අදාල වේ.

දැනට රබර් සඳහා ඉතිරිව ඇති එකම ක්‍රියා මාර්ගය නම් ක්ලෝන ස්වරූපයෙන් විශාල එකතුව පවත්වා-ගැනීමය. එයට අධික මුදලක් වැය වන අතර, රෝගාබාධ හා වෙනත් ස්වාභාවික ආපදා මගින් එය විනාශවීම් වලට ලක් වීමට ද ඉඩ තිබේ. අනෙක් එකම විකල්පය නම් කිණක රෝපණ ලෙසින් එකතු පවත්වා-ගැනීම යි. එවැනි ශිල්ප ක්‍රමයක් භාවිතා කිරීමේ හැකියාව රඳා පවත්නේ පරිපූර්ණ පටක රෝපණ ශිල්ප ක්‍රම තිබීම මතයි. එහෙත්, දැනට නම් රබර්, තේ සහ පොල් වැනි වෘක්ෂ භෝග සඳහා එවන් පටක රෝපණ ශිල්පක්‍රම නොමැත්තේය.

නව ජනකප්ලස්ම එකතු කිරීමට අමතර වශයෙන එකතුවෙහි ඇති යහපත්, ජාන හඳුනා-ගැනීම සඳහා අභිජනකයන් විසින් එකතුව ඇගයිය යුතු ය. යහපත් ජාන සියල්ල ම අඩංගු වඩා හොඳ ප්‍රභේද ලබා-ගැනීම සඳහා. දැනට ඇති අභිජනන ගභණය තුළට එවැනි යහපත් ජාන ඒකාබද්ධ කිරීමට ඔවුන් සමත් වන්නේ එසේ කිරීමෙන් පමණකි.

කැලයේ වැවෙන සම වර්ගයේ නෑදෑ ගස්වලින් ලබා-ගත් සම්මත ජනකප්ලස්ම එකතුවලට අමතරව, ජෛවතාක්ෂණ වැඩ-සටහන් මගින. නව ප්‍රාවේණික ද්‍රව්‍ය නිෂ්පාදනය කල හැකි ය. කෘතිම ක්‍රමවලින් ප්‍රේරණය කල විකෘති ස්වරූප මීට අයත් වේ. අනාගත අභිජනන කටයුතුවල දී මෙවැනි විකෘතීන් ප්‍රයෝජනවත් වනු ඇත.

(අනුවාදය උපාලි කන්නන්ගර විසිනි).